මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ

හා

අභ්‍යාස ආයතනය

# වාර්ෂික වාර්තාව

# 2014

මැණික්හා ස්වර්ණාභරණ පර්යේෂණ
හා අභ්‍යාස ආයතනය
නවනුවර පාර
මාළඹේ

ගරු පරිසර පුනර්ජනනීය හා බලශක්ති අමාත්‍යතුමා,
පරිසරපුනර්ජනනීය හා බලශක්ති අමාත්‍යංශය,
සම්පත්පාය,
නො 82,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

ගරු අමාත්‍යතුමනි,

<u>**වාර්ෂික වාර්තාව 2014**</u>

1971 අංක 38 දරණ මුදල් පනතේ 14(2) උප වගන්තිය ප්‍රකාරව පහත සඳහන් ලේඛන ඔබ වෙත ඉදිරිපත් කරමි.

1. 2014 වර්ෂය සඳහා වු මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ පාලන වාර්තාව.
2. 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වු ආයතනයේ ආදායම් හා වියදම් වාර්තාව, 2014 දෙසැම්බර් 31 දිනට ශේෂපත්‍රය හා 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වුමුදල් ප්‍රවාහ ප්‍රකාශය
3. 2014 වර්ෂය සඳහා වන විගණකාධිපති වාර්තාව

මෙයට විශ්වාසී,

ටී.එම් සිරිසෝම
සභාපති
මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය

# දැක්ම මෙහෙවර හා අභිමතාර්ථ

## දැක්ම

" මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධිය හා සංවර්ධනය සඳහා අදාල පර්යේෂණ හා පුහුණු කටයුතු කරමින් කලාපයේ විශිෂ්ඨතම පර්යේෂණ හා පුහුණු මධ්‍යස්ථානය වීම"

## මෙහෙවර

" මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය ඉතා තරඟකාරී මට්ටමේ කුසලතාවයන් වැඩි දියුණු කිරීම තුලින් අප සේවා දායකයන්ට උපරිම අන්දමේ සේවාවක් ලබා දීමට අදාල නව මැණික් තැන්පතු හඳුනා ගැනීම සඳහා ගවේෂණ කටයුතු මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තයේ අභිවෘද්ධියට අදාල නව නිපැයුම් බිහි කිරීම හා ඒවායේ අගය වැඩි කිරීමට අදාල ශිල්පීය හා තාක්ෂණික දැනුම හා කුසලතා වලින් පිරිපුන් ශ්‍රමිකයන් බිහි කිරීම මෙන්ම කර්මාන්තයට අදාල වැඩමුළු සඟරා පොත්පත් හා පර්යේෂණ ග්‍රන්ථ පල කිරීම අපගේ මෙහෙවරයි "

## අභිමතාර්ථ

" ශ්‍රී ලංකාවේ මැණික් ඛනිජ සම්පත් විභව ප්‍රදේශ ගවේෂණය කර තිරසාර ලෙස නෙලා ගැනීම සහ නව තාක්ෂණික ක්‍රම පිළිබඳ පුහුණුවක් සහිත ශ්‍රමිකයන් තුලින් ජාතික ආර්ථිකයට දායක වීම"

## 2.අධ්‍යක්‍ෂ මණ්ඩල සංයුතිය

### 2.1 2014වර්ෂය තුල ආයතනයේ අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික සංයුතිය පහත සදහන් පරිදි විය

| | | |
|---|---|---|
| 01 | ටි එම් සිරිසෝම මයා (සභාපති) | 2013.04.17 දින සිට2014.12.16 දක්වා අධ්‍යක්ෂ මණ්ඩල සභාපති |
| 02 | සෙනෙරත් ජයසුන්දරමයා | 2013.04.30 දින සිට 2014.12.16 දක්වා<br>අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික (භූ විද්‍යා හා පතල් කාර්යාංශය-සභාපති) |
| 03 | ජානක උදය කුමාරමහතා | 2013.04.30 දින සිට 2014.06.23 දක්වා<br>අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික (මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය-අධ්‍යක්ෂ ජනරාල්) |
| 04 | එම්.ඒ.එස්.එච් පෙරේරා | 2014.01.29 දින සිට 2014.12.16 දක්වා<br>අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික |
| 05 | එම්.කේ.ජී.කේ නැම්මවත්ත | 2013.04.25 දින සිට 2015.05.21 දක්වා<br>අධ්‍යක්‍ෂ මණ්ඩල සාමාජික |

### 2.2 ඉහළ කළමණාකාරිත්වය

තිලක් ධර්මරත්න -ආයතනයේ අධ්‍යක්‍ෂ ජනරාල්

( B.Sc, M.Sc in Gemmology (SL), M.Sc (UK) (2000.08.01 –අද දක්වා)

## 3. සමාලෝචිත වර්ෂයේ අවස්ථා සහ අභියෝග පිළිබඳ සභාපතිතුමාගේ සමාලෝචනය

### 3.1 අවස්ථා

- **පර්යේෂණ සහ පුහුණු සඳහා ඉල්ලුම වැඩි කිරීම**

  ආයතනයේ සේවාවන් සඳහා දේශීය හා විදේශීය ඉල්ලුම් වර්ධනය වෙමින් තිබේ. මෙම ක්ෂේත්‍රයේ පුහුණු ශ්‍රමිකයින් සඳහා හොඳ ඉල්ලුමක් පැවතීම මෙම ඉල්ලුම වර්ධනය කිරීමට හේතු වී ඇත. මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනයේ සේවාවන් වල ගුණාත්මක තත්වය ඉහල නැංවීමට ගත් ක්‍රියාමාර්ග හරහාද මෙම සේවාවන් වල ඉල්ලුම වැඩි වීමට හේතු වී ඇත. මෙම කෙෂ්ත්‍රයට අදාලව සම්පූර්ණ පරාසය තුල පුහුණු සේවාවන් ලබා දෙන වෙනත් කිසිදු ආයතනයක් නොමැත. එසේම මෙම කර්මාන්තයට අවශ්‍ය පර්යේෂණ අවශ්‍යතා සපුරාගෙන සේවා සපයන්නෙකු ද කලාපය තුල නොමැත. එසේම දැනට සීඝ්‍ර වර්ධනයක් අත්පත් කරගනිමින් තිබෙන  උතුරු සහ නැගෙනහිර ප්‍රදේශ වල පුහුණු වෙළඳපොල අවශ්‍යතාවයන් සැපිරීමද සිදුකිරීමේ අවකාශය ඇත.

- **සම්පූර්ණ වී නොමැති අවශ්‍යතා**

  කෙෂ්ත්‍රය සඳහා සේවා සපයන්නන් විසින් සම්පූර්ණ නොකරන ලද අවශ්‍යතා තවමත් ඇත. මේ යටතේ ක්‍රමවත් මැණික් නිධි ගවේශණ, ප්‍රාථමික මැණික් නිධි හඳුනාගැනීම, ප්‍රාථමික මැණික් නිධි ලබා ගැනීමේ තාක්ෂණය සැලසුම් කිරීම හා සැකසීම, සහ පරිඝණක ආශ්‍රිත ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණ සහ නිෂ්පාදනය වෙනුවෙන් පුහුණුව ලබාදීම වෙනුවෙන්ද ඇතුලත් වේ.

- **තාක්ෂණික අභිවර්ධනය**

  මැණික් නිධි කැණීම සහ මැණික් වල වර්ණය වැඩි දියුණු කිරීම වැනි කටයුතු සඳහා නව යන්ත්‍රෝපකරණ සොයා ගැනීම සහ හඳුන්වාදීම සඳහා ද ඉඩ ප්‍රස්ථාවක් ඇත.

- **ආයතනයේ දියුණුව**

  ලෝකයේ විවිධ ප්‍රදේශ වල සේවා ලාභින් සඳහා සේවය ලබාදීමට ආසියානු පැසිපික් කලාපයේ මැණික් හා ස්වර්ණාභරණ විශ්ව විද්‍යාලයක් මට්ටමට මෙම ආයතනය උසස් කිරීමේ අවශ්‍යාවය ද ඇත.

- **වෙනත් පහසුකම්**

  ගෙවුඩ තාප පිරියම් කිරීමේ මධ්‍යස්ථාන ශ්‍රී ලංකාවේ වෙනත් ස්ථාන වල ස්ථාන ගත කිරීම සහ පර්යේෂණ පහසුකම් මගින් ද මෙම කෙෂ්ත්‍රය වෙනුවෙන් විශාල සේවාවන් ලබා දීම සඳහා අසමසම මට්ටමක ආයතනය පවතී.

- **කර්මාන්තයේ දියුණුව සඳහා සංධිය වැඩසටහන්**

  පරිසර අධිකාරීන් සමග මැණික් කර්මාන්තය සඳහා පරිසර හිතකාමී ක්‍රම සඳහා අනුබල දීමද, ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය සමග පර්යේෂණ ව්‍යාපෘති සඳහාද, වෙනත් රාජ්‍ය ආයතන සමග විවිධ සංවර්ධන ව්‍යාපෘති සඳහාද සහ සම්බන්ධ වෙමින් කටයුතු කිරීමේ අවස්ථාවන් ඇත.

- **ප්‍රචාරක වැඩසටහන්**

  ආයතනයේ සේවාවන් පිළිබඳ මහජනතාව වෙත ප්‍රචාරණය කිරීමේ වැඩසටහන් දියත් කිරීම කල යුතුව ඇත. මේ සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන්, මැණික් හා ස්වර්ණාභරණ සඟරා සහ පුවත් පත්‍රිකා, ශ්‍රව්‍ය දෘශ්‍ය ඉදිරිපත් කිරීම් ආදිය යොදාගත හැක.

## 3.2 අභියෝග

- **යටිතල පහසුකම්**

  පුහුණු ඒකක වල ප්‍රමාණවත්ව නවීන පහසුකම් හා යන්ත්‍ර උපකරණ සංවර්ධනය වී නොමැත. එවැනි උපකරණ මෙම පුහුණු ඒකක වලට හඳුන්වා දී ඒ හරහා කර්මාන්තයෙහි ප්‍රගමනයට අවශ්‍ය පුහුණුවල දැනුම හා කුසලතාවය ලබා දීමට කඩිනම් පියවර ගත යුතු වේ. ස්වර්ණාභරණ පුහුණු ඒකක වල මැණික් කැපීමේ ඒකකය හා මැණික් රසායනාගාරය සඳහා ඉතා දියුණු යන්ත්‍ර උපකරණ හඳුන්වා දිය යුතු වේ. තවද ලෝහ ප්‍රමිතිය නිශ්චය කිරීමේ ඒකකයක් ආරම්භ කර ඒ ආශ්‍රිත පාඨමාලා හඳුන්වා දිය යුතුව ඇත. දියමන්ති කැපීම මෙම කර්මාන්තයේ සුවිශේෂී කර්මාන්තයක් වන බැවින් ඒ සඳහා අදාල පුහුණු ඒකකයක් ස්ථාපනය කර දැනුම ලබාදීම හා ඒ ආශ්‍රිත සංවර්ධන කටයුතු සඳහා පියවර ගතයුතු වේ.

- **භෞතික සම්පත්**

  ආයතනයේ පර්යේෂණ හා පුහුණු අංශයේ වැඩකටයුතු ප්‍රසාරණාත්මක මට්ටමකින් කරගෙන යාමට අවශ්‍ය වාහන හා උපකරණ වල හිඟකමක් දක්නට ඇත. තවදවර්තමාන අවශ්‍යතාවයට සරිලන පරිදි පර්යේෂණාගාර පහසුකම්ද වැඩිදියුණු කිරීමට අවශ්‍යව ඇත.

- **සේවකයන්ගේ දුර්වල ආකල්ප**

  මෑත අතීතයේ සේවකයන් තුල සෘණාත්මක ආකල්පමය මානසික පසුබිමක සිටීම.

- **සහෝදර ආයතන මගින් අපගේ සේවාවන්ම සිදුකිරීම**

  උදාහරණ:- අපගේ පුහුණු, රසායනාගාර සේවා ආදිය.

- **මානව සම්පත්**

  කළමණාකරණ සේවා චක්‍රලේඛ අංක 30 අනුව සකස් කරන ලද ආයතනයේ නව සේවක සැලැස්මහි ඇති ආයතනයට අවශ්‍ය තනතුරු වලින් සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්), සහකාර අධ්‍යක්ෂ (මුල්‍ය),පර්යේෂණ නිලධාරීන්, වැඩ සටහන් නිලධාරී යන තනතුරු සඳහා බඳවාගැනීමට කටයුතු කර ඇත.

  ආයතනයේ පර්යේෂණ හා පුහුණු කාර්ය මණ්ඩලය සඳහා දේශීයව තිබෙන පුහුණු අවස්ථාවන් සීමාසහිතවීම නිසා සහ මෙම ක්ෂේත්‍රයේ විෂය දැනුම සහිතව සිටින නිළධාරීන් සීමිත වීම නිසා පුහුණු අවස්ථාවන් සඳහා යොමුකිරීමට ඇති අවස්ථාවන් අවම වීම නිසා අප කාර්ය මණ්ඩලය වර්තමාන කර්මාන්තයේ ඉල්ලුම සැපිරීමට ප්‍රමාණවත් නොවන බව පෙනියයි. එය කර්මාන්තයේ අනාගතයට හිතකර නොවන අතරම ආයතනයේ පුහුණු ඉල්ලුම පහලයාමට බලපෑ හැකිය. ආයතනයේ කාර්ය මණ්ඩලය සඳහා හැකිතාක් දේශීය හා විදේශීය පුහුණු අවස්ථාවන් ලබා දීමෙන් මෙම තත්වය සඳහා විසදුම් ලබා ගත හැකි වේ.

- **මූල්‍ය සම්පත්**

  වර්තමාන අවස්ථාවලට අනුව ආයතනයේ වැඩ කටයුතු ප්‍රසාරනාත්මක මට්ටමකින් කරගෙන යාමට ප්‍රමාණවත් අරමුදල් දායකත්වයක් මහාභාණ්ඩාගාරය වෙතින් ලැබේ.

- **පෞද්ගලික අංශයේ පුහුණු ආයතන බිහි වීම-**

  මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ අධ්‍යාපන කටයුතු සඳහා පෞද්ගලික අංශයේ මැදිහත්වීම ක්‍රමයෙන් වර්ධනය වී ඇත.

- **කර්මාන්තයේ සමහර අංශ වල දිරිගැන්වීම් නොතිබීම-**

  උදාහරණ:- සේවා කැපුම් අංශය

- **භූ විද්‍යාඥයන්ගේ හා පුහුණු විශේෂඥයන්ගේ හිඟකම**

- **පර්යේෂකයන්ට සහ පුහුණු කරුවන්ට උසස් පුහුණු කටයුතු සඳහා අවස්ථාවන් නොමැති කම සහ අධ්‍යක්ෂ ජනරාල්, පර්යේෂණ හා පුහුණු සහ අනෙකුත් ආධාරක කාර්යය මණ්ඩලය අතර සේවක පරතරයක් පැවතිම**

## 4. අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

### 4.1 අරමුණු

1993 අංක 50 දරණ ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරී පාර්ලිමේන්තු පනතේ 25(1) වගන්තිය ප්‍රකාරව 1995 ජුලි 28 දිනැති හා අංක 882 ගැසට් නිවේදනය මගින් මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය පිහිටුවනු ලැබීය. ආයතනයේ ප්‍රධාන අරමුණු වන්නේ පර්යේෂණ සහ පුහුණු පහසුකම් හරහා මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්තය විධිමත් කිරීමල වැඩි දියුණු කිරීම හා සංවර්ධනය කිරීමයි.

### 4.2 ආයතනයේ බලතල

1995 ජුලි 28 දිනැති අංක 882 දරණ ගැසට් පත්‍රය මගින් ආයතනයට පවරා ඇති බලතල පහත දැක්වේ.

(i) ශ්‍රී ලංකාවේ මැණික් ඛනිජ හා එම නිධි පිලිබඳව සමීක්ෂණය කිරීම හා ඊට අදාල පහත සඳහන් කරුණු ගැන විද්‍යාත්මක පර්යේෂණ ක්‍රියාත්මක කිරීම

- i ඒවායේ පිහිටීම
- ii හඳුනා ගැනීම
- iii මැණික් ගල් අනර්ගිකරණය කරන ක්‍රම
- iv ආයතනයට සම්බන්ධ වෙනත් ක්ෂේත්‍ර වල කටයුතු

(ii) පතල් කැපීම, මැණික් කැපීම, ස්වර්ණාභරණ නිෂ්පාදනය සහ මැණික් පිරියම් ක්‍රම යන අංශ වලට අදාලව මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත සංවර්ධනය සඳහා යන්ත්‍ර සූත්‍ර නිපදවීම ඇතුලු තාක්ෂණික හා අනෙකුත් උපදෙස් ලබාදීම.

(iii) පහත සඳහන් පුහුණුව ලබා දීම.

- i මැණික් කැපීම
- ii ස්වර්ණාභරණ නිෂ්පාදනය
- iii දියමන්ති ඇතුලු රත්න විද්‍යාව
- iv ස්වර්ණාභරණ මෝස්තර නිර්මාණය
- v මැණික් ගල් අනර්ගිකරනය හා ගෙවුඩ තාපකරණය ඇතුලුව
- vi මැණික් හා ස්වර්ණාභරණ කර්මාන්ත වලට සම්බන්ධ අනෙකුත් අංශ

### 4.3ක්‍රියාකාරකම් හා කාර්යක්‍ෂමතාවය

4.3.1 පුහුණු පාඨමාලා දිවයිනේ ප්‍රචලිත කිරීම සඳහා පියවර ගෙන තිබූ අතර තරුණ තරුණියන් අඛණ්ඩව පාඨමාලා සඳහා යොමු වීමේ ප්‍රවනතාවයක් දක්නට ඇත.

**අධ්‍යාපන පුහුණු සහ පර්යේෂණ කාර්යයන්**

- **2014 වර්ෂය තුළ පුහුණු කරන ලද සිසුන් සංඛ්‍යාව**

| පාඨමාලාව | සිසුන් සංඛ්‍යාව |
|---|---|
| රත්න විද්‍යාව | 120 |
| ගෙවුඩ තාප පිරියම්කරණය | 86 |
| මැණික් කැපීම හා ඔප දැමීම | 122 |
| මැණික් වර්ණ ශ්‍රේණිගත කිරීම හා අලෙවිකරණය | 195 |
| ස්වර්ණාභරණ මොස්තර නිර්මාණය | 27 |
| ස්වර්ණාභරණ නිෂ්පාදනය | 49 |
| මුළු එකතුව | 599 |

- **2014 වර්ෂය තුළ පවත්වන ලද වැඩමුළු සහ සම්මන්ත්‍රණ**

| අනු අංකය | දිනය | ප්‍රදර්ශණය සම්මන්ත්‍රණය හෝ වැඩමුලුව | ස්ථානය |
|---|---|---|---|
| 2014 | | | |
| 1 | 2014.02.21/ 27 | දැයට කිරුළ ජාතික සංවර්ධන වැඩසටහන සහ ප්‍රදර්ශනය | කුලියාපිටිය, වයඹ විශ්ව විද්‍යාලය |
| 2 | 2014.04.01 | අපනයන සංගමය (EDB) මගින් පවත්වන ලදමැණික් කැපීම සහ ඔප දැමීම පිළිබඳ වැඩමුලුවකට සහභාගි වීම | ගාල්ල අපනයන සංගම් කාර්යාලය (EDB) |
| 3 | 2014.04.27 | නිවිතිගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය සංවිධානය කරන ලද අලුත් අවුරුදු සැණකෙළිය සහ අධ්‍යාපනික සහ වෙළඳ ප්‍රදර්ශනය | නිවිතිගල ප්‍රාදේශිය ලේකම් කාර්යාලය |
| 4 | 2014.05.05 | නිවිතිගල යොවුන් සේනාංක පුහුණු ශිෂ්‍ය ශිෂ්‍යාවන් දැනුවත් කිරීමේ වැඩමුලුවකට සහභාගි වීම | නිවිතිගල යොවුන් සේනාංකය |
| 5 | 2014.05.23/24 | රුවන්පුර තරුණෝදය ප්‍රදර්ශනය සඳහා සහභාගි වීම | සීවලි ක්‍රීඩාංගනය නවනගරය රත්නපුර |
| 6 | 2014.05.29 | ඇඹිලිපිටිය මහවැලි කලාපයේ ආයතනයේ පුහුණු පාඨමාලා පිළිබඳ ප්‍රචාරණය | ඇඹිලිපිටිය |
| 9 | 2014.10.11 | මහනුවර බාලසූරිය සමාගමේ වැඩමුලුවක් සඳහා සහභාගි වීම | මහනුවර |
| 10 | 2014.12.10 | ගම්පොළ යොවුන් සේනාංක සිසුන් දැන්වත්වීමේ වැඩසටහනකට සහභාගි වීම | ගම්පොළ |

**මානව සම්පත් සංවර්ධනය**

| නම | තනතුර | වැඩමුළුව / පාඨමාලාව | ආයතනය | දිනය |
|---|---|---|---|---|
| නලින්ජයසිහ මයා | අංශ ප්‍රධානි (පර්යේෂණ) | Practical Aspect of Bid Evalution | ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය | 2014.03.13-14 |
| වසන්තගම්ලත් මයා | සහාකර අධ්‍යක්ෂ (රත්නවිද්‍යා) | | | |
| රංගිසෙනෙවිරත්න මෙනෙවිය | තොරතුරු හා ලේඛන නිලධාරි | පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව | කුසලතා සංවර්ධන අරමුදල් ආයතනය | 2014.05.05-09 |
| ඉනෝකාරාජපක්ෂ | සහකාර අධ්‍යක්ෂ (පරිපාලන හා මානව සම්පත්) | Labour Law & Industrial Relations in the Private Sector | ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය | 2014.05.29-30 |
| එස්.එල්.ජේ.මුහන්දිරම්මයා | සහකාර අධ්‍යක්ෂ මූල්‍ය) | මුදල් ප්‍රවාහ හා මුදල් කලමණාකරණ පාඨමාලාව | ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය | 2014.06.30 |
| ධනුෂ්කරවීන්ද්‍රසිංහ මයා | පර්යේෂණනිලධාරි | Effective Letter Writing & Wrtten Communication Techniques | National Institute of Business Management | 2014.06.03-04 |
| සමුද්‍රාවිජේවර්ධන මෙනෙවිය | | | | |
| එම්.කේ.ඩී.ජයමාලිමෙනෙවිය | | | | |
| චන්දිමවැවේගෙදර මයා | | | | |
| සිසිරකුමාරමයා | කළමණාකරනසහකාර | නිවාඩු, නිවාඩු පිළිබඳ වාර්තා එහි බලපෑම හා පුද්ගලික ලිපිගොනු කළමණාකරණය | ශ්‍රීලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය | 2014.09.01-02 |
| ධම්මිරූපසිංහ මිය | කළමණාකරනසහකාර | අලාභ වාර්තා කිරීම, හානි පූර්ණය හා කපා හැරීම පිළිබඳ එක් දිනවැඩමුළුව | ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය | 2014.09.11 |
| එස්.එල්.ජේ.මුහන්දිරම්මයා | සහකාර අධ්‍යක්ෂ මූල්‍ය) | Financial Reporting in compliance with the Sri Lanka Public Sector Accounting Standards | ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනය | 2014.10.08 හා 2014.11.04 |
| ධම්මිරූපසිංහ මිය | කළමණාකරනසහකාර | | | |

**පර්යේෂණ අංශය**

**01) .ශ්‍රී ලංකාවේ මැණික් නිධි ගවේෂණය හා තක්සේරු කිරීමේ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය අවුරුදු 2500 ක පමණ අතීතයකට දිවයන අතර දැනට ලෝකයේ හමුවන මැණික් වර්ග 200 අතුරින් 70ක් පමණම ශ්‍රී ලංකාවේ දක්නට ලැබේ. ලෝකයේ මැණික් සම්පත බහුල රටවල් පහ අතුරින් එකක් වන ශ්‍රී ලංකාවේ භූමියෙන් 90% ක් පමණම මැණික් විභවයන් සහිත බව තක්සේරු කර ඇත. නමුත් ස්වභාවික පරිසරයට අවම හානියක් වන පරිදි ඒවා කැණීම් සිදු කිරීම වර්තමානයේ කර්මාන්තය මුහුණ දෙන ප්‍රධාන අභියෝගය වේ.

මෙයට පිළියමක් ලෙස "මහින්ද චින්තන නව ශ්‍රී ලංකාවක් කරා දස අවුරුදු දැක්ම" අනුව මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය මගින් තිරසාර උපයෝජනයක් වෙනුවෙන් මැණික් නිධි හඳුනාගැනීමට, විභවය ඇගයීමට සහ ලැයිස්තුගත කිරීමට ශ්‍රී ලංකාවේ ක්‍රමවත් මැණික් නිධි ගවේෂණ වැඩසටහනක් යෝජනා කර ඇත. මෙම ව්‍යාපෘතියේ මූලික අරමුණ වනුයේ ශ්‍රී ලංකාව පුරා මැණික් විභව සිතියම් නිර්මාණය කිරීම මගින් මැණික් හා ස්වර්ණාභරණ ක්ෂේත්‍රයේ නියැලී සිටින කොටස් කරුවන්ගේ දියුණුව දියුණුව සැලසීම හරහා රටේ තිරසාර සංවර්ධනයයි. 2008 වර්ෂයේදී මේ සඳහා විස්තරාත්මක යෝජනාවක් කැබිනට් මණ්ඩලය වෙත ලබාදුන් අතර ඒ සඳහා අවශ්‍ය අරමුදල් හා අනුමැතිය ලැබී ඇත. ඒ අනුව මෙම ව්‍යාපෘතිය ඌව පළාතේ මොණරාගල දිස්ත්‍රික්කයේ (රූප සටහන 01) ක්‍රියාත්මකව පවතී.

2014 වර්ෂය වන විට මෙම ව්‍යාපෘතිය මොණරාගල දිස්ත්‍රික්කයේ බඩල්කුඹුර, මැදගම, බිබිල, සියඹලාන්ඩුව, මොණරාගල හා මඩුල්ල යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලද ආරම්භ කෙරුණු අතර මොණරාගල හා බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ව්‍යාපෘති කටයුතු අවසන් අදියරේ පැවති අතර මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අවසන් සිතියමද මේ වන විට අවසන් කර ඇත.(රූප සටහන 02). බඩල්කුඹුර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අවසන් සිතියමද මේ වන විට නිම වෙමින් පවතී. (රූප සටහන 03)




රූප සටහන 01: අධ්‍යයන ප්‍රදේශ





රූප සටහන 2-a: පර්යේෂණ කණ්ඩායම ක්ෂේත්‍ර ගවේෂණයේදී- මොණරාගල




රූප සටහන 02-b:මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අවසන් සිතියම



රූප සටහන 03: පර්යේෂණ කණ්ඩායම ක්ෂේත්‍ර ගවේෂණයේදී - බඩල්කුඹුර

**02). තිරසාර සංවර්ධනයක් සඳහා පරිසර හිතකාමී මැණික් පතල් කැණීමේ ක්‍රම හඳුන්වා දීමේ ව්‍යාපෘතිය**

මැණික් පතල් කැණීම හා ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් හේතුවෙන් ස්වභාවික පරිසර තත්වයන් තර්ජනයට ලක්වී ඇත. මේවා අවම කිරීමටත්, ඊට පිළියම් වශයෙන් නව පරිසර හිතකාමී පතල් කැණීම් ක්‍රමවේදයන් හඳුන්වා දීමත් අප ආයතනය සතු වගකීමකි.

"මහින්ද චින්තන ඉදිරි දැක්ම" අනුව 2013 වර්ෂයේදී මෙම ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කෙරුණි.

මෙම ව්‍යාපෘතිය 2014 වර්ෂයේදී බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමෙන් සිදු කරනු ලැබූ අතර, ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු අවසන්(රූප සටහන 04) කර එම අධ්‍යයනයන් මගින් පරිසර සංවේදීතාවයන් හා දැනට කෙරෙන කැණීම් ක්‍රම වල අක්‍රමිකතා හඳුනාගත් අතර ඒ අනුව යෝජිත නව ක්‍රමවේදයන් ඇතුලත්ව අවසන් වාර්තාවක් හා සිතියමක්(රූප සටහන 05) සකස් කරන ලදී.



රූප සටහන 04: බදුල්ල දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර ගවේෂණ කටයුතු




රූප සටහන :05හඳුනාගත් පාරිසරික තර්ජනාත්මක ප්‍රදේශ

03) ප්‍රකාශන

ඉහත සදහන් ව්‍යාපෘති වලට අදාලව 2014 වර්ෂයේදී පර්යේෂණ පත්‍රිකා පහක් ප්‍රකාශයට පත් කර ඇත.

1. R.M.N.P.K. Jayasinghe, S.V.T.D. Raveendrasinghe, G.G.M.S. Wickramasinghe, T.S. Dharmaratne, 'Evaluation of Favourable Factors for the Formation of Gem Deposits: A Study in Ambanganaga Area inNaula, Sri Lanka', Proceedings of the International Forestry and Environment Symposium 2014 of the Department of Forestry and Environmental Science, University of Sri Jayawardanapura, Sri Lanka, 2014, pp 96.

2. M.K.C. Jayamali, S. Wijewardane, R.M.N.P.K. Jayasinghe, T.S. Dharmaratne, G.H.S.R. Siripala, 'Scientific Eco-Friendly Gem Mining Techniques for Sustainable Development – A Study From Badulla District', Proceedings of the International Forestry and Environment Symposium 2014 of the Department of Forestry and Environmental Science, University of Sri Jayawardanapura, Sri Lanka, 2014, pp 97.

3. S.V.T.D. Raveendrasinghe , R.M.N.P.K. Jayasinghe, T.S. Dharmaratne, and H.M.R. Premasiri, 'Provenance of the Gem Deposits in Badalkumbura Region, Sri Lanka', Proceedings of the International Forestry and Environment Symposium 2014 of the Department of Forestry and Environmental Science, University of Sri Jayawardanapura, Sri Lanka, 2014, pp 98.

4. Wewegedara W.G.C.N., Jayasinghe R.M.N.P.K., Dharmaratne T.S., Premasiri H.M.R., 'Occurrences of Gem Deposits In KumbukkanOya Alluvium Deposit in Monaragala' , Proceedings of the International Forestry and Environment Symposium 2014 of the Department of Forestry and Environmental Science, University of Sri Jayawardanapura, Sri Lanka, 2014, pp 99.

5. G.G.M.S. Wickramasinghe, S.V.T.D. Raveendrasinghe, R.M.N.P.K. Jayasinghe, T.S. Dharmaratne, 'Geomorphological and Spatial Analysis on Depositional Environment of Gold Bearing Gem Deposits of Kelani River Bed Around Kumarimulla, Pugoda, Sri Lanka', Proceedings of the International Forestry and Environment Symposium 2014 of the Department of Forestry and Environmental Science, University of Sri Jayawardanapura, Sri Lanka, 2014, pp

(168)

## Provenance of the Gem Deposits in Badalkumbura Region, Sri Lanka

**Raveendrasinghe S.V.T.D.[1*], Jayasinghe R.M.N.P.K.[1], Dharmaratne T.S.[1], Premasiri H.M.R.[2]**

[1]*Gem and Jewellery Research and Training Institute, Malambe, Sri Lanka*
[2]*Department of Earth Resources Engineering, Faculty of Engineering, University of Moratuwa, Moratuwa, Sri Lanka*
**07tdanushka@gmail.com*

### Abstract

Badalkumbura divisional secretariat which belongs to the Monaragala district of Uva province is the well known for gem occurrences situated on the South-Eastern slope of central uplands. Kumbukkan Oya and Menik Ganga are the main surface streams which are annually recharged with mostly North-Eastern monsoonal rain flows across this region. Also, both stream courses were supported by widely distributed perennial and seasonal drainage network. According to the Monaragala - Panama 1:100000 geology map published by Geological survey and mines bureau, Sri Lanka, this area belongs to the Highland Complex close to the boundary of Highland and Vijayan complexes. With the aid of preliminary field explorations, both primary and secondary gem occurrences were identified as gem fields. Furthermore, extent and distribution of the identified gem fields were analysed using GIS and Remote Sensing, and detailed maps were prepared. Based on this map, exploratory auger sampling was carried out in selected sites representing particular gem field. Then, the gem bearing gravel layer of each site was carefully selected from the sampled geological successions and sieve analysis was carried out. Then graphical representation of particle size distributions of each sample was compared with available references.

According to the field observations, garnet sillimanite graphite gneiss and impure marble are the source rocks which were formed under silica under-saturate conditions at the Precambrian times to occur both primary and the secondary gem deposits. Due to high weathering susceptible mineralogical composition of both parent rocks give rise to form residual primary gem deposits until they expose for denudation. On the other hand, denudation on such primary residuals ends up with the formation of secondary gem deposits following the local drainage network. Also, geomorphology along these drainage networks is the governing factor to form a gem deposit at a specific localized point or a region. Ridge and valley uneven topography of Northern and the North-Western region of the study area comprise mostly weathered residual type gem deposits with the combination of secondary colluvial type gem deposits. Due to violence nature of young stage river courses grab debris with gems from those deposits and secondary alluvial type gem deposits were form when they meet the planer morphology. Continuation of this process during the long period of time form extended secondary gem deposits. Well graded particle size distribution curves also prove that provenances of primary gem deposits and the secondary colluvial type gem deposits. Well sorted particle size distributions are characterized by the identification of secondary alluvial type gem deposits in this region.

***Keywords***: Gem, Provenance, Highland Complex

(169)

# Gem Occurrences in Kumbukkan Oya Alluvium Deposit in Monaragala District

**Wewegedara W.G.C.N.[1*], Jayasinghe R.M.N.P.K.[1], Dharmaratne T.S.[1], Premasiri H.M.R.[2]**

[1] *Gem and Jewellery Research and Training Institute, Malambe, Sri Lanka*
[2] *Department of Earth Resources Engineering, Faculty of Engineering, University of Moratuwa, Moratuwa, Sri Lanka*
**chandimawgcn@gmail.com*

**Abstract**

Estimation shows nearly one fourth of the total land area of Sri Lanka is potentially gem bearing. Gem mining has been mostly confined to terrains predominantly underlain by highland complex high grade metasedimentary rock suites. However, secondary gem deposits are found in many parts of the island. Alluvium of Kumbukkan Oya is one of the major favourable areas for secondary gem occurrences in Moneragala district, Sri Lanka.

Mining history was studied and stream sediments were collected during primary field visits in the study area. Sieve analysis was performed and mineral identification were carried out under the polarising microscope. Kumbukkan Oya stream origins from Lunugala area and flows along well developed valleys and foremost tributaries intercept it at Badalkumbura area. Its' pertinent catchment area belongs to Highland Complex. Topographic altitude changes at lower rates towards Monaragala area making the river up to matured phase and allowing heavier clastic sediments to be deposited more easily with alluviums. Thus the alluvium deposits composed of gem gravels due to their favourable depositional environment. Gem mining is being carried out along either river banks in Badalkumbura, Nakkala, Kumbukkana and Okkampitiya areas.

Two tributaries with the same name 'Kuda Oya' that originate from Badalkumbura area, bare less transported gem stones within poorly sorted sediments with preserved crystal shapes which may derived at the vicinity. Sub angular to rounded stones are observed with moderately sorted sediments, dominantly towards Monaragala division that may have transported from distances. Only alluvial forms of gem deposits are found in the areas underlain by Vijayan rock suites, which are metamorphosed under the amphibolite facies condition.

According to the field observations and the Monaragala-Panama 1:100000 geology map published by Geological Survey and Mines Bureau the source rocks for genesis of the gems may be predominantly khondalite, garnetiferous gneise and calc gneiss (skarn). Mining in paleo river bed could be observed that consists of sandy clay, clayey silt and soil above the gem bearing sediment bed. Depth to the gem bearing gravel beds varies from 2 to 7 meters which are much shallower than the common Ratnapura gem beds. Therefore the deposition may be a younger event or the upper profiles have been washed by the runoff. Yellow sapphire, blue sapphire, geuda, tourmaline, spinal and garnet gem varieties are most commonly identified in the Kumbukkan Oya gem field.

***Keywords**:* Alluvial, Flood plain, Paleo river bed

(167)

## Scientific Eco-Friendly Gem Mining Techniques for Sustainable Development – A Study from Badulla District

**Jayamali M.K.C.*, Wijewardane S., Jayasinghe R.M.N.P.K., Dharmarathne T.S., Siripala G.H.S.R.**

*Gem and Jewellery Research and Training Institute, Malambe, Sri Lanka*
**jayamalimkc@gmail.com*

**Abstract**

Gem mining in Sri Lanka has been laid into the practice using traditional techniques since its commencement around twenty centuries earlier. Substantial environmental and social impacts caused due to gem mining and associated activities, which has been arisen along with the increment of the population density with respect to the land area. Management of these impacts in a responsible manner is a huge challenge to the industry. Badulla district as one of the major gem mining districts was the selected for the study. This study is a scientific approach to assess the current gem mining methods with their environmental impacts with the view of introduces eco-friendly gem mining methods. Approximately 98% of Gem potential areas are belonging to Highland Complex of Sri Lankan metamorphic units and rest of them lie on boundary between Highland and Vijayan Complexes. The area exhibits an undulate morphology with an irregular network of streams which are controlled by the underling geology and structures. Gems are being mined mainly from alluvial deposits in river-cut valleys and in-situ deposits. They have been found mostly on steep sloppy areas which directly cause for landslides as well as cutting failures.

There is no scientific systematic method for gem exploration has been used and traditional methods based on penetrating ground with a pointed steel rod *(illamkoora)*, historical mining records, practical experiences, hypothesis, and oblations as well have been applied. About 50% of Illicit gem mining closer to small stream beds and natural forests such as Dummala Ara, Namunukula areas have high impact on environmental strata. Favorable areas for gem deposits can be scientifically investigated by using classification of remote sensing data, depth as well as extent of the gem gravel bed in particular areas can be demarcated using geo technical (Core drilling) and geo physical (GPR survey, Resistivity survey) survey. This will minimize the environmental impacts due to unsystematic mining. Further, illicit mining and malpractices should be discouraged and be introduced measures to mitigate their impacts through awareness programs. Establishment of silt traps and pollution control dams may minimize soil erosion, land degradation and excessive sedimentation in water bodies. River dredging should be extremely limited to prevent river course alteration, to minimize bank erosion and to control floods. Releasing mine drainage to water bodies is permissible only after a systematic purification. A buffer zone may be demarcated around archaeological and cultural sites. Further, proper systematic backfilling and compaction of the mined areas, construction of retaining walls, soil nailing on unstable slopes are introducible in rehabilitation of mined land. Mining at the toes of old landslides should be avoided. Eventually, the industry could be redirected by publishing the gem potential maps resultant from the identified scientific techniques and introducing community the environmental friendly gem mining techniques facilitating sustainable development, according to national development guidelines.

***Keywords***: Gem mining, Eco friendly, Environmental Impacts

(P-19)

# Geomorphological and Spatial Analysis on Depositional Environment of Gold Bearing Gem Deposits of Kelani River Bed around Kumarimulla, Pugoda, Sri Lanka

**Wickramasinghe G.G.M.S.*, Raveendrasinghe S.V.T.D., Jayasinghe R.M.N.P.K., Dharmaratne T.S.**

*Gem and Jewellery Research and Training Institute, Malambe, Sri Lanka*
**rfmahesh@gmail.com*

## Abstract

Kelani river bed in Pugoda area has been dredged for sand as a construction material for many decadesmainly during dry seasons. Recently, a rush has been created among villagers of this area, when they found gold and gems in considerable amounts in the very bottom of the river bed believing it as a sudden fortunate gift from a God. It aroused the scientific curiosity and therefore this study was conducted for the determination of scientific background of the depositional environment for thisvaluable gemdeposit mainly focusing geomorphology and other spatial factors.

Geology, geomorphology, structural geologyand fluvialsystem of the area, and the mineralogy of the gold and gem bearing layer were scientifically examinedand integrated using GIS to identify the possible factors for the formation of the deposit. According to the microscopic mineralogical analysis of the gold and gem bearing layer, gold flakes and gem minerals such as corundum, tourmaline, spinel, garnet and zircon were observed in allsieve fractionsof 2mm, 1mm, 500µm, 250µm and 125µm in varying percentages. Further, sedimentological analysis revealed that, the sediments are poorly sorted and have been transported a long distance for a long period, as indicated by their substantial roundness. According to fluvial morphometric interpretations basedon topographical and satellite imagery datathe bed-load and suspended materials which have beenaccumulatedfrom hilly areas due to erosion, has tended to get deposited in thisfavourable lower-lying area.Moreover, it was observed at the particular location that, the river has bent and a ridge of the bed rock lies from left river bank up to the middle of the river flow pathright after the bend. They have made this location a great calm depositional environment for the sediments. This tends this location for the deposition of gold and gem bearing sedimentsconsiderably. Therefore, it is concluded that geomorphology and other spatial factors havesignificantly contributed for the formation of this alluvial gold and gem bearing deposit.

***Keywords:*** Alluvial deposit, Geomorphology, Fluvial system, Gem

## විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශය

**පසුගිය අවුරුදු 05 සඳහා වූ මූල්‍ය තොරතුරු**

| | 2010 | 2011 | 2012 | 2013 | 2014 |
|---|---|---|---|---|---|
| **මෙහෙයුම් ආදායම්** | | | | | |
| භාණ්ඩාගාර ප්‍රධාන පුනරාවර්තන | 25,885 | 27,420 | 29,629 | 32,113 | 43,357.0 |
| වෙනත් දායක විම් | 8,322 | 12,500 | 13,853 | 13,020 | 13,862.9 |
| පාඨමාලා ගාස්තු | 2,397 | 3,256 | 5,228 | 3,949 | 6,941 |
| සේවා ගාස්තු ආදායම් | 24 | 25 | 30 | 15 | |
| භූ විද්‍යා පර්යේෂණ සේවාවන්ගෙන් ලැබීම් | | | | | |
| **මුළු මෙහෙයුම් ආදායම්** | **36,628** | **43,201** | **48,740** | **49,097** | **64,161** |
| වෙනත් ආදායම් | | 44 | 223 | 38 | 303 |
| පොලි ආදායම | 159 | 166 | 309 | 406 | 309 |
| වෙනත් ලැබීම් | 164 | 205 | 140 | 54 | |
| **මුළු ආදායම** | **36,952** | **43,616** | **49,412** | **49,595** | **64,773** |
| අඩුකලා - වියදම් | | | | | |
| ඒ සේවක හා පරිපාලන වියදම් | 28,629 | 30,328 | 35,403 | 37,260 | 44,558 |
| බී ක්ෂය සහ පොදු වියදම් | 9,102 | 12,905 | 14,217 | 13,452 | 17,572 |
| **මුළු වියදම්** | **37,732** | **43,233** | **49,619** | **50,712** | **62,130** |
| **අතිරික්තය (ඌණතාවය)** | **(779)** | **383** | **(207)** | **(1117)** | **2,643** |

**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ අභ්‍යාස ආයතනයේ 2013.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආදායම් වියදම් ප්‍රකාශය**

| **විස්තරය** | 2014 | | 2013 | |
|---|---|---|---|---|
| | රු..000 | රු..000 | රු..000 | රු..000 |
| **මෙහෙයුම් ආදායම්** | | | | |
| පුනරාවර්තන ප්‍රදාන -භාණ්ඩාගාර | | 43,357.0 | | 32,113.2 |
| **වෙනත් ආදායම්** | | | | |
| පාඨමාලා ගාස්තු | | 6941.2 | | 3948.8 |
| ගෙවුඩ තාපකරණ ගාස්තු | | | | 15.0 |
| භූ විද්‍යා පර්යේෂණ සේවා | | | | |
| පොලී ආදායම් | | 309.3 | | 406.9 |
| විවිධ ආදායම් | | 303.6 | | 53.7 |
| **මෙහෙයුම් ආදායම් එකතුව** | | **50,911.1** | | **36,537.5** |
| **අඩු කලා : මෙහෙයුම් වියදම්** | | | | |
| කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා | | 23,092.9 | | 20,998.8 |
| ගමන් වියදම් | | 279 | | 403.3 |
| සැපයුම් හා පාරිභෝජන ද්‍රව්‍ය | | 1,753.3 | | 1,291.6 |
| නඩත්තු වියදම් | | 2,676.2 | | 1978.6 |
| ගිවිසුම් ගත සේවා | | 14,588.1 | | 11,603.3 |
| පුහුණු වියදම් | | 1,321.1 | | 782.7 |
| වෙනත් මෙහෙයුම් වියදම් | | 759.7 | | 182.2 |
| **මෙහෙයුම් වියදම් එකතුව** | | **44,470.3** | | **37,240.6** |
| **මෙහෙයුම් වලින් ලද අතිරික්තය/ (ඌනතාවය)** | | **6,440.8** | | **(703.1)** |
| අඩු කළා - මූල්‍ය පිරිවැය | | (88.2) | | (19.5) |
| ප්‍රාග්ධන වියදම් සඳහා ප්‍රතිපාදන | 7,382.5 | | 6,567.8 | |
| වෙනත් ලැබීම් | | | | |
| | 7,382.5 | | 6,567.8 | |
| අඩු කළා - ක්ෂය කපා හැරීමේ වියදම් | (11,092.2) | (3,709.7) | (7,000.7) | (432.9) |
| වෙනත් ප්‍රාග්ධන ආයෝජන ප්‍රතිපාදන | 6480.4 | | 6452.1 | |
| අඩු කළා - ප්‍රාග්ධන ආයෝජන වියදම් | (5357.4) | | (5299.8) | |
| ප්‍රාග්ධන වත්කම් සංවර්ධනය කිරීම් | (1123.0) | | (1152.3) | |
| වෙනත් ප්‍රාග්ධන ආයෝජන වල ශුද්ධ වියදම | | | | |
| මෙහෙයුම් නොවන ආදායම් | | **(3797.8)** | | **(452.4)** |
| **එකතු කලා වත්කම් විකිණීමෙන් ලද ආදායම** | | | | 38.3 |
| **අති විශේෂ අයිතමයන්ට පෙර අතිරික්තය/(ඌනතවය)** | | 2642.9 | | (1,117.2) |
| අති විශේෂ අයිතම | | | | |
| **කාලසිමාව සඳහා ශුද්ධ අතිරික්තය / ඌනතාවය** | | 2642.9 | | (1,117.2) |
| එකතු කලා | | | | |
| පෙර වර්ෂය සඳහා ශුද්ධ අතිරික්තය /(ඌනතාවය) | (63955.78) | | (62,840.0) | |
| අඩු කළා - පෙර වර්ෂ ගැලපීම් | | (151.1) | | 1.4 |
| ශුද්ධ අතිරික්තය /(ඌනතාවය) | | **(61,464.0)** | | **(63,955.8)** |

**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ අභ්‍යාස ආයතනයේ**
**2014දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය**

| විස්තරය | 2014 | | 2013 | |
|---|---|---|---|---|
| | රු.'000 | රු.'000 | රු.'000 | රු.'000 |
| **වත්කම්** | | | | |
| **ජංගම නොවන වත්කම්** | | | | |
| දේපල යන්ත්‍ර උපකරණ | 6,9830 | | 27,696 | |
| පාරිතෝෂික අරමුදල | 1863 | 71,693 | 1,770 | 29,465 |
| **විලම්භිත වියදම්** | | | | |
| නවීකරණ සහ වෙන් කිරීමේ වියදම් | | | | |
| **ජංගම වත්කම්** | | | | |
| තොග හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය | 833 | | 1,256 | |
| අඩු කළා: ලියා හැරීම් සඳහා වෙන් කිරීම් | (648) | | (648) | |
| | 186 | | 608 | |
| විකිණීම සඳහා ඇති පොත් | 62 | | 67 | |
| ණය හා අත්තිකාරම් | 977 | | 707 | |
| බැංකු තැන්පතු ගිණුම් (කෙටිකාලීන) | 3,610 | | 3,355 | |
| තැන්පතු | 2,700 | | 675 | |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ගිණුම් | 616 | | 40 | |
| පෙර ගෙවීම් | 114 | | 110 | |
| මුදල් හා බැංකු | 16,295 | 24,559 | 14,708 | 20,272 |
| **වත්කම් එකතුව** | | 96,253 | | 49,737 |
| **වගකීම්** | | | | |
| **ජංගම වගකීම්** | | | | |
| ගෙවිය යුතු ගිණුම් | 240 | | 257 | |
| උපචිත වියදම් | 2,364 | | 3,327 | |
| ණය හිමියෝ | 119 | | 119 | |
| උපයන විට ගෙවීම් බදු | 1 | | 14 | |
| ගෙවිය යුතු ගමන් වියදම් | 231 | 2,955 | 0.67 | 3,718 |
| **ජංගම නොවන වගකීම්** | | | | |
| පාලන ගිණුම් (ජා. මැ. ස්. අධිකාරිය) | 3,179 | | 3,179 | |
| ප්‍රදාන-(වෙනත් ආයතන) | 232 | | 232 | |
| පරිතෝෂික සඳහා වෙන්කිරීම් | 9,908 | | 9,385 | |
| සේවක ආරක්‍ෂක තැන්පතු | 10 | 13,329 | 10 | 12,806 |
| **වගකීම් එකතුව** | | 16,285 | | 16,523 |
| **ශුද්ධ වත්කම් එකතුව** | | **79,968** | | **33,214** |
| **ශුද්ධ වත්කම් / ස්කන්ධ** | | | | |
| සහභාගිත්ව ප්‍රාග්ධනය | | 50,000 | | 50,000 |
| සංචිත | | 4500 | | 3,000 |
| වෙනත් දායක වීම් | | 850 | | 850 |
| සේවක චක්‍රිය අරමුදල | | 834 | | 819 |
| විලම්භිත ආදායම් රැ ප්‍රාග්ධන ප්‍රතිපාදන | | 85,247 | | 42,500 |
| සමුච්චිත අරමුදල | | (61,464) | | (63,956) |
| **ශුද්ධ වත්කම් ස්කන්ධ එකතුව** | | **79,968** | | **33,214** |

**මැණික් හා ස්වර්ණාභරණ පර්යේෂණ හා අභ්‍යාස ආයතනය**

**2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය**

| | 2014 | 2013 |
|---|---|---|
| **මෙහෙයුම් කාර්යන්ගේ මුදල් ප්‍රවාහය** | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද අතිරික්ත (ඌනතාව) | 2,642.7 | (1,155.5) |
| **මුදල් නොවන ගනුදෙනු** | | |
| ක්ෂය වෙන්කිරීම | 11,092.5 | 7,007.7 |
| ප්‍රාග්ධන වියදම් කපාහැරීම් | 6,480.3 | (6,452.1) |
| විලම්භිත ප්‍රාග්ධන ආදායම් ගැලපීම් | (13,862.4) | (13,020.2) |
| පෙර වර්ෂයේ ගැලපීම් | (151.1) | - |
| ගෙවීම් වැඩිවීම්/අඩුවීම් | (993.0) | (604) |
| අනෙකුත් ජංගම වගකීම් වල වැඩි වීම | 232.0 | (208.2) |
| සේවක පිරිවැය සඳහා ප්‍රතිපාදන වල වැඩි වීම | 524.0 | 411.5 |
| අනෙකුත් ජංගම වත්කම් වල වැඩි වීම | (2,703.0) | 808 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (අ)** | 3,262.0 | (315.7) |
| **ආයෝජන කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය** | | |
| යන්ත්‍ර හා උපකරණ මිලදී ගැනීම | (30,127.7) | (11,195.5) |
| පාරිතෝෂික අරමුදලේ වැඩිවීම | (93.0) | (470) |
| ආයෝජන විකිණීම් වලින් ලැබීම් | (6480.3) | (6452.1) |
| ෂංචිත වල වැඩිවීම | 15.0 | 22 |
| ස්ථාවර වත්කම් විකිණීම් | (21,599.0) | 38.3 |
| **ආයෝජන කාර්යයන්ගේ ශුද්ධ මුදල් ප්‍රවාහය (ආ)** | (58,285.0) | (18,057.3) |
| **<u>මුල්‍ය කාර්යයන්ගේ මුදල් ප්‍රවාහය</u>** | | |
| ප්‍රාග්ධන ප්‍රදාන | 56,610.0 | 29,550.0 |
| රජයට විශේෂ අය වීම් | | |
| **මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ)** | 56,610.0 | 29,550.0 |
| මුදල් හා මුල්‍ය අයිතමයන්ගේ ශුද්ධ වැඩිවීම/අඩුවීම (අ) (ආ) (ඇ) | 1,587.0 | 11,177.0 |
| ආරම්භක මුදල් /මුල්‍ය ශේෂය | 14,708.0 | 3,531.0 |
| **වර්ෂය අවසානයේ මුදල් / මුල්‍ය ශේෂය** | **16,295.0** | **14,708.0** |